## සාමාන්‍යාධිකාරී MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

1. සංචාරක විෂයය ක්ෂේත්‍රය හා කළමනාකරණ විෂය ද ඇතුළුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු සංචාරක විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**සහ**

ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳව මනා හැකියාවක් තිබීම.

**සහ**

ප්‍රජා සම්බන්ධතාවය සහ මනා සන්නිවේදන කුසලතාවයකින් යුක්ත වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

කනිෂ්ඨ කළමනාකාර (JM) සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම අවුරුදු පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස

අවු. 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වෙනත්

සෑම ඉල්ලුම්කරුවෙක්ම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම, බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මෙන්ම, බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය සහ මාසික වැටුප් පරිමාණය**

**MM 1-1 2016 (රු.53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575)**

## <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

**විවෘත තරඟ විභාගය**

විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

- භාෂා ප්‍රවීණතාවය
- අභියෝගතා පරීක්ෂණය

**භාෂා ප්‍රවීණතාව**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ රීති භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝගතා පරීක්ෂණය**

තනතුරට අදාළ කාර්යයන් මනාව ඉටු කිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝගතාව සහ හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

විභාගයෙන් සමත්වීම සඳහා අපේක්ෂකයෙකු විසින් එක් එක් විෂයයක් සඳහා නියමිත ලකුණු වලින් අවම වශයෙන් 40% ක් සහ සියලු විෂය සඳහා මුළු එකතුව අවම වශයෙන් ලකුණු 50% ක් ලබාගත යුතුය.

**සහ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා / කාර්යය සාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | ලකුණු 100 |

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

## සංචාරක ප්‍රවර්ධන නිලධාරී JM 1-1 (තනතුරු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. සංචාරක ක්ෂේත්‍රයකින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හෝ අලෙවිකරණය පිළිබඳ විෂයය ක්ෂේත්‍රයකින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබීම.

ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව හා වෙනත් භාෂාවන් පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**<u>සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය සහ මාසික වැටුප් පරිමාණය</u>**

**JM 1-1- 2016 ( රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580 )**

<u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

**විවෘත තරඟ විභාගය**

**ලිඛිත තරඟ විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දැක්වේ.**

- භාෂා ප්‍රවීණතාවය
- අභියෝගයතා පරීක්ෂණය
- තනතුරට අදාළ වන විෂය දැනුම

**භාෂා ප්‍රවීණතාව**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝගයතා පරීක්ෂණය**

සිය නිල කාර්යයන් මැනවින් ඉටු කිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝගයතාව ද හැකියාවද මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම**

තනතුරට අදාළ වන පරිදි නියමිත විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයෙකු එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු අතර, මුළු ලකුණු එකතුව 50% ක් අවම වශයෙන් ලබා ගත යුතුය.

**සහ**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම.**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | ලකුණු | 100 |

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

## <u>සංවර්ධන නිලධාරී MA - 03 (තනතුරු 06)</u>

**<u>සුදුසුකම්</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**හෝ**

ගෘහ නිර්මාණ ශිල්පය විෂය ක්ෂේත්‍රය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව හා වෙනත් භාෂාවන් පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

<u>වයස</u>

අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**<u>වෙනත්</u>**

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

<u>සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය සහ මාසික වැටුප් පරිමාණය</u>

**MA 03 - 2016 (රු. 32,200 -10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 54,960 )**

<u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

**ලිඛිත තරඟ විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දැක්වේ.**

- භාෂා ප්‍රවීණතාවය
- අභියෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදාළ වන විෂය දැනුම

**භාෂා ප්‍රවීණතාව**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්ණ පත්‍රයකි.

**අභියෝග්‍යතා පරීක්ෂණය**

සිය තනතුරෙහි කාර්යභාරය ඉටුකිරීම පිණිස අපේක්ෂකයා තුළ පවත්නා අභියෝග්‍යතාව සහ හැකියාව මෙහිදී පරීක්ෂා කෙරේ.

**තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම**

අදාළ තනතුරට පැවරෙන විෂය සම්බන්ධව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම අරමුණයි.

විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයෙකු එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු අතර, මුළු ලකුණු එකතුව 50% ක් අවම වශයෙන් ලබා ගත යුතුය.

**සහ**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම.**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුනු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | ලකුණු 100 |

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1 - 1 (තනතුරු 03)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

* සිංහල / දෙමළ

* ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් සේ සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘ආ’, ‘ඇ’, ‘ඉ’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

* සිංහල / දෙමළ

* ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්වී තිබීම.

(පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැකිය.)

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවු.05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස**

අවු.18 ට නො අඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය සහ මාසික වැටුප් පරිමාණය**

**MA 1 - 1- 2016 (රු.27,910 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - රු.48,540)**

**බඳවා ගැනීමේ ක්‍රමය**

**ලිඛිත තරඟ විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දැක්වේ.**

- භාෂා ප්‍රවීණතාවය
- අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
- පරිගණක පරීක්ෂණය

**භාෂා ප්‍රවීණතාව**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සාමාන්‍ය ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු කෙරෙහි අපේක්ෂකයාගේ කුසලතාව මැන බැලීම සඳහා වන ප්‍රශ්ණ පත්‍රයකි.

**අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම**

තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටුකිරීම සඳහා අපේක්ෂකයා තුළ ඇති අභියෝග්‍යතාව හා කුසලතාව ද වර්තමාන තත්ත්වයන් පිළිබඳ ඔහුගේ දැනුම ද පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**පරිගණක පරීක්ෂණය:**

තොරතුරු තාක්ෂණයට අදාළ මූලික සංකල්ප සහ පරිගණක භාවිතයට අදාළ විවිධ භාවිතාවන් සහ ගොනු කළමනාකරණය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා හැකියාව මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි.

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා අපේක්ෂකයන් විසින් එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක්ද, විෂයයන් තුන සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන බාහිර අපේක්ෂකයන්

විභාගයේදී ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව තීරණය කෙරේ. කෙසේ වෙතත්, විභාගය සමත් වන සියලුම අභ්‍යන්තර අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සහ**

**සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම.**

**සම්මුඛ පරීක්ෂණය**

බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | ලකුණු 100 |

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවන්ට අමතරව රජය විසින් කලින් කළට තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවයන්ද සියලුම සේවකයන් විසින් නියමිත පරිදි ලබා ගත යුතු වේ.